# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1909/50 – 2015 අප්‍රේල් 10 වැනි සිකුරාදා – 2015.04.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2015 අංක 77 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/8/2012/පීසී/319.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මීරි/ඉ/5/45/2013.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, මීරිගම.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහපත්තුව සුළු කොට්ඨාසයේ, බෝතලේ පහළගම ගමේ පිහිටි ගම්පහ දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/මීරි/2014/178 හා 2014.08.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0254ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගලබොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0254**

උතුරට: මාර්ගය සහ ඒ. පී. එල්. ඒ. ගංගා අමරසිරි හිමිකම් කියන ගලබොඩවත්ත; නැගෙනහිරට: ඒ. පී. එල්. ඒ. ගංගා අමරසිරි හිමිකම් කියන ගලබොඩවත්ත සහ කුඩාවිදානගේ හිමිකම් කියන ගලබොඩවත්ත; දකුණට: කුඩාවිදානගේ හිමිකම් කියන ගලබොඩවත්ත; බටහිරට: කුඩාවිදානගේ හිමිකම් කියන ගලබොඩවත්ත සහ මාර්ගය.

04 - 831


1A – G 21393– 82 (2015/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2007 සැප්තැම්බර් මස 18 වැනි දින අංක 1515/11 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද 2007 අංක 192 දරන (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/එච්ඩබ්/එස්ටීඩීපී/ජේබීඅයිසී/389.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ව/ඉ2/201/01වී
2015 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැදුර',
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පස්දුන් කෝරළය දකුණ සුළු කොට්ඨාසයේ හල්වල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 81 හා 2008.07.01 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම් :

**01. කැබලි අංක 820 – පෙරියහේනවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0050**
උතුරට: කැබලි අංක 4 සහ 739; නැගෙනහිරට: කැබලි අංක 4, 739, 740 සහ 821; දකුණට: කැබලි අංක 821 සහ 4; බටහිරට: කැබලි අංක 4.

**02. කැබලි අංක 822 – පෙරියහේනවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0033**
උතුරට: කැබලි අංක 821, 740 සහ 741; නැගෙනහිරට: කැබලි අංක 741, 742 සහ 823; දකුණට: කැබලි අංක 823 සහ 4; බටහිරට: කැබලි අංක 4 සහ 821.

**03. කැබලි අංක 824 – පෙරියහේනවත්ත පිටකට්ටිය – ප්‍රමාණය: හෙක්. 0.0091**
උතුරට: කැබලි අංක 823, 742 සහ 747; නැගෙනහිරට: කැබලි අංක 747, 748 සහ 825; දකුණට: කැබලි අංක 825 සහ 4; බටහිරට: කැබලි අංක 4 සහ 823.

04 - 832

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2003 මාර්තු මස 06 වැනි දින අංක 1278/15 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2003 අංක 34 දරන ආඥාවේ කැබලි අක්ෂර 'ඒ' ලෙස සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2002/එන්එච්/212.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 1/71/1/128.
2015 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැදුර',
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ අඟුලාන උතුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක පී.පි.කො. 8645 හා 2003.10.15 වැනි දිනැති මූලික පිඹුරේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0384ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම් :

**01. කැබලි අංක 05 – පීරුගහවත්ත හෙවත් නුගෙවත්ත හෙවත් මුනගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0384**
උතුරට: වරි. අංක 268සී, සමගි මාවත සහ කැබලි අංක 1; නැගෙනහිරට: කැබලි අංක 1; දකුණට: කැබලි අංක 1 සහ 6; බටහිරට: කැබලි අංක 6 සහ වරි. අංක 268සී.

04 - 833

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.